# දෙපාර්ශවයක් අතර ඇති කර ගන්නා එකඟතා ගිවිසුමයි

මෙහි මින්මතු පළමු පාර්ශවය යනුවෙන් සඳහන් කෙරෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2011 අංක 05 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සංශෝධිත 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතින් සථාපිත වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙනුවෙන් ........................................................................................................ දිස්ත්‍රික්කයේ ........................................................................ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් වන ........................................................................................................................................................... ................................................................................ යන අය

(එකී ප්‍රාදේශීය ලේකම් සහ එම ධූරයට තත්කාලීනව පත්වන්නන්, වැඩබලන්නන් සහ එම ධූරයට අයත් කාර්යයන් සහ කර්තව්‍යයන් ඉටුකරනු ලබන්නන් ද) පළමු පාර්ශවයට ද,

.........................................................................................................................................................

ලිපිනයෙහි පිහිටි (විහාරස්ථානයේ / පූජා ස්ථානයේ / ආයතනයේ/ ස්ථානයේ) .............................. (විහාරාධිපති / පියතුමා / කන්‍යා සොහොයුරිය/ භාරකරු / හිමිකරු ) ...................................... වන ( සම්පූර්ණ නම) ........................................................................................................................................................... ........................................................................................... (ජා: හැ: අංකය : ........................................ )

(එකී (නායක සවාමීන් වහන්සේ / පියතුමා / කන්‍යා සොහොයුරිය / භාරකරු / හිමිකරු) ...................................................................... සහ එම (විහාරස්ථානයේ / පූජා ස්ථානයේ / ආයතනයේ /ස්ථානයේ ) ............................................................ (විහාරාධිපති / පියතුමා / කන්‍යා සොහොයුරිය/ භාරකරු / හිමිකරු ) ....................................................................... ධූරයට අනාගතයේ දී පත්වන (නායක ස්වාමීන් වහන්සේලා / පූජක තුමන්ලා / භාරකරුවන් / හිමිකරුවන් ) ....................................................................... සහ උරුමක්කාර, පොල්මඃකාර, අද්මිනිස්ත්‍රාසිකාර, බලකාර, ලැබුම්කාර ආදීන්ගේ ද ) දෙවන පාර්ශවයට ද,

බැඳී එකී පාර්ශවය අතර වර්ෂ දෙදහස්............................ ක් වූ ................................... මස ....................... වන දින (20........./......../........) පහත සඳහන් පොරොන්දු ගිවිසුම් වලට යටත්ව මෙම ගිවිසුමට එළඹෙන ලදි.

**ඒ අනුව සියල්ලෝම දැනගත යුතු වග නම්:-**

1. නියෝජනය කිරීම සහ වගකීම්

1.1. මෙම ගිවිසුමට එළඹීමට සහ මෙම ගිවිසුම යටතේ ඇති බැඳීම් නිසි පරිදි ඉටුකිරීමට තමන්ට සම්පූර්ණ අයිතිය, බලය, හැකියාව සහ අධිකාරිය ඇති බවට එක් එක් පාර්ශව කරුවන් විසින් අනෙක් පාර්ශවය වෙත වගකියනු ලැබේ.

1.2. මෙම ගිවිසුම සඳහා එළඹීමට අවශ්‍ය කරන සෑම සියළු තොරතුරක් ම සහ කරුණක් ම පාර්ශව කරුවන් විසින් ලබාදෙනු ලැබේ.

1.3. මෙම ගිවිසුම සම්පූර්ණ වශයෙන්ම පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය අතර පවතින ගිවිසුමක් වන අතර මෙම ගිවිසුම යටතේ තමන්ට පැවරෙන යුතුකම්, වගකීම් සහ බැඳීම් තෙවන පාර්ශවයක් වෙත පැවරිය නොහැක.

2. ගිවිසුම් කාලය

මෙම ගිවිසුම වර්ෂ දෙදහස් ............................... ක් වූ ..................................................මස ..................... වන (20......./....../......) දිනෙන් ආරම්භ වී වර්ෂ දෙදහස් ............................ ක් වූ .................................. මස .......................... වන දින (20....../....../.....) දක්වා වූ වසර 30ක (තිහක) කාලයක් සඳහා වලංගු වේ.

3. පළමු පාර්ශවයේ හිමිකම් සහ බැඳීම්

3.1. පළමු පාර්ශවය වන වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත දෙවන පාර්ශවය විසින් කාර්යය සිදු කරගෙන යාම සඳහා ලබා දෙනු ලබන භූමියෙහි (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය / පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ / ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ / වෙනත් සඳහන් කරන්න) ........................................................................................................................ ලියාපදිංචි ........................................................ අංකය දරණ (සංගමය / පදනම / සමිතිය / සංවිධානය/ වෙනත් සඳහන් කරන්න) ........................................................................................ විසින් පවත්වාගෙන යනු ලබන .......................................................................... දිස්ත්‍රික්කයේ .................................................................................................. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ................................................................................................................ ග්‍රාම නිලධාරී වසමේ ........................................................................................................................................ ............................................................................... යන ලිපිනයෙහි පවත්වාගන යනු ලබන .................... වර්ෂයේ (ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය /පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ / වෙනත් සඳහන් කරන්න ) ........................................................................................................ ...................................................... ලියාපදිංචි ............................................................ අංක දරණ (වැඩිහිටි නිවාසයේ නම) ......................................................................................................................... ............................................................ යන වැඩිහිටි උවටැන් නිවාස සඳහා (නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම / අළුත්වැඩියාවක් / ඉදිකිරීමක් / වෙනත් සඳහන් කරන්න) .................................................................................................................................................... ............................................................ සිදු කරනු ලැබේ.

3.2. එම ගොඩනැගිල්ල තුළ ( සංගමයේ / පදනමේ / සමිතියේ / සංවිධානයේ / ආයතනය නම) ............................................................................................. විසින් පවත්වාගෙන යනු ලබන (වැඩිහිටි නිවාසයේ නම) ............................................................................................................ .................................................... යන වැඩිහිටි උවටැන් නිවාසය නිසි පරිදි පවත්වාගෙන යාම ................................................. ප්‍රාදේශීය ලේකම් මඟින් අධීක්ෂණය සිදුකිරීම.

3.3. ඉහත 3.1 හි සඳහන් කාර්යය සඳහා වන වියදම දෙපාර්ශවය විසින් ම දරණු ලබන බවට දෙපාර්ශවයම එකඟ වේ.

4. දෙවන පාර්ශවයේ හිමිකම් සහ බැඳීම්

4.1. දෙවන පාර්ශවය විසින් සිය (විහාර / පූජ්‍ය ස්ථාන / ආයතන / වෙනත් සඳහන් කරන්න) ....................................................... භූමියේ ඉහත 3.1 කාර්යය සඳහා සුදුසු (ඉඩම / ඉඩම් කොටස ) ................................... එනම් , අක්කර ................. රූඩ් .................. පර්චස් ....................... ක ප්‍රමාණයක් වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙත පවරා දීමට මෙයින් එකඟ වේ.

4.2. එම භූමිය තුළ පළමු පාර්ශවය විසින් සිදුකරන් ලබන ඉහත 3.1 කාර්යය සඳහා ද එම ගොඩනැගිල්ල තුළ (සංගමයේ / පදනමේ / සමිතියේ / සංවිධානයේ / ආයතනයේ නම ) .................................................... විසින් පවත්වාගෙන යනු ලබන (වැඩිහිටි නිවාසයේ නම) .................................................................. ............................................................................................................................................. යන වැඩිහිටි උවටැන් නිවාසය නිසි පරිදි , කිසිදු බාධාවකින් හා අවහිරතාවයකින් තොරව පවත්වාගෙනයාම සඳහා අවසර දෙන බවට දෙවන පාර්ශවය එකඟ වේ.

5. මෙම ගිවිසුම් පත්‍රයේ වගන්ති සබැඳියාව දෙපාර්ශවයේ යම් ගැටලුකාරී තත්වයක් උද්ගත වුව හොත් එය සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගැනීමටත්, එසේ නොහැකි වූ හොත් දිස්ත්‍රික් ලේකම් තුමා සමඟ සාකච්ඡාකර විසඳා ගැනීමටත්, එසේ ද විසඳා ගැනීමට අපොහොසත් වන යම් ගැටළුවක් වේ නම්, වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර විසඳා ගැනීමට දෙපාර්ශවය මෙයින් එකඟ වේ.

6. මෙම ගිවිසුම් පත්‍රය සම්බන්ධයෙන් වන සියලුම කටයුතු නීත්‍යානුකූලව අවසන් වන තෙක් අවශ්‍ය සෑම අවස්ථාවකම ඒ සම්බන්ධව ඉහත කොන්දේසි ප්‍රකාරව කටයුතු කරන බවට ත්, මෙම ගිවිසුම දෙපාර්ශවයේම එකඟතාවය මත අවසන් කරන තෙක් කිසිඳු හේතුවක් නිසාවෙන් ගිවිසුම් පත්‍රයේ කොන්දේසිවලින් ඉවත් නොවන බවට ත් දෙපාර්ශවය මෙයින් එකඟ වේ.

7. මෙම ගිවිසුම් පත්‍රය සම්බන්ධව සිදුවන සෑම ලිපි ගණුදෙනුවක් ම ඉහත සඳහන් කරන ලද ලිපිනයන් අනුව සිදුවන අතර එකී ලිපිනයන්ගේ යම් වෙනසක් සිදුවන්නේ නම් ලිපිනයන් වෙනස් කරනු ලබන පාර්ශවය විසින් අනෙක් පාර්ශවය වෙත දින හතක් ඇතුළත දැනුම් දීමට එකඟවේ.

8. මෙම ගිවිසුමට අදාලව දෙවන පාර්ශවය විසින් සිදුකරනු ලබන යම්කිසි පවරාදීමක් සම්බන්ධව එකී පාර්ශවයට වන්දි අයකරගැනීමට ඇති අයිතිය එකී දෙවන පාර්ශවය විසින් මෙයින් අත්හරින බවට දෙපාර්ශවයම පිළිගනී. ඒ බව සනාථ කිරීම සඳහා දෙවන පාර්ශවය විසින් ලබාදෙන ලද දිවුරුම් ප්‍රකාශය (X) ලෙස සළකුණුකොට මෙම ගිවිසුමේ කොටසක් ලෙස පවතී.

9. මෙම ගිවිසුමට අදාලව දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත පවරන ලද දේපල වලට අදාල පැවරුම් ඔප්පුව (Xi) ලෙස සළකුණුකොට මෙම ගිවිසුමේ කොටසක් ලෙස පවතින බවට දෙපාර්ශවයම පිළිගනී.

10. මෙම ගිවිසුම ලියාපදිංචි නොකිරීම මත මෙම ගිවිසුමේ නීත්‍යානුකූල භාවයට හානියක් සිදු නොවන බවට දෙපාර්ශවය විසින් ම පිළිගනී.

ඉහත සඳහන් පොරොන්දු ගිවිසුම් හොඳින් කියවා තේරුම් ගෙන ඊට එකඟ වූ පළමු පාර්ශවයට බැඳුණු වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව වෙනුවෙන් ........................................................................ දිස්ත්‍රික්කයේ .................................................... ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම් සහ දෙවන පාර්ශවයට බැඳුණු (සම්පූර්ණ නම) ........................................................................................................................... ............................................................................................ (ජා: හැ: අංකය : .......................................... ) යන අයට ද

මෙයටත් මෙම වගන්තිය දරණ තවත් ලියවිලි දෙකකටත් වර්ෂ දෙදහස් ............................... ක් වූ ...................................................... මස ............................................. වන දින (20........../....../......) ....................................................................... දී අත්සන් තබන ලදි.

..........................................................

................................................ ප්‍රාදේශීය ලේකම්
පළමු පාර්ශවය

පළමු පාර්ශවයේ සාක්ෂි

I. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

II. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

...........................................................

.....................................................................................
දෙවන පාර්ශවය

දෙවන පාර්ශවයේ සාක්ෂි

I. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-

II. අත්සන :-
නම :-
ජා: හැ: අංකය :-
ලිපිනය :-